# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2229/2 - 2021 මැයි මස 24 වැනි සඳුදා - 2021.05.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, "වෙල්කම්හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" යන ආයතනය සම්බන්ධයෙන් 2016 ජූලි මස 04 වැනි දින අංක 1974/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද පශ්චාත් නියමය මගින් සංශෝධිත 2012 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 1782/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමයට තවදුරටත් වූ වශයෙන් මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි,

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදනය කරන ලද කාලසීමාව 2022.01.01 වැනි දින සිට තවදුරටත් වූ මාස දහඅටක (18) කාලසීමාවක් සඳහා දීර්ඝ කිරීම පිණිස 3 වන වගන්තියේ (4) වන උවගන්තිය යටතේ 2016 ජූලි මස 04 වැනි දින අංක 1974/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද පශ්චාත් නියමය මගින් සංශෝධිත 2012 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 1782/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ (4) වන වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ඃ

"(4) බස්නාහිර පළාතේ, කොළඹ 01, කොළඹ කොටුව යන ස්ථානයේ පිහිටි සුඛෝපභෝගී හෝටලයක් ඇතුලු මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් ඉදි කිරීම, ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය විසින්, සංශෝධිත 2008 අංක 14 දරන ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය විසින්, සංශෝධිත 2008 අංක 14 දරන ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් මිශ්‍ර භාවිත ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලැබීමේ දිනයේ සිට වූ කාලසීමාව ඇතුළත 2023.06.30 වැනි දින ස්වකීය මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

**මහින්ද රාජපක්ෂ, පා.ම.,**
මුදල් අමාත්‍ය.

2021 මැයි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

06 - 194

1A - PG 5447— 545 (2021/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*